# 14 කාරක

**කාරක** නම් කරන්නා යනු යි. ක්‍රියාවක කරන්නා කවුරු ද යන්න මෙයින් කියැවේ. නැති නම් උක්තය කවුද යන්න යි. කරන්නා කර්තෘ වූ විට එය **කර්තෘ කාරක ය.** කරන්නා හෙවත් උක්තය කර්මය වූ විට එය **කර්ම කාරකයයි.** ක්‍රියා මාත්‍රයක් හැඟවෙන ලෙස යමක් කෙරේ නම් ඒ **භාව කාරකයයි.**

මතකයට

| | |
|---|---|
| කර්තෘ කාරක | = කතු කිරිය |
| කර්ම කාරක | = කම් කිරිය |
| භාව කාරක | = භව් කිරිය |

**කර්තෘ කාරක**
බල + ඊ
බැලී

**භාව කාරක**
නට + එයි
නැටෙයි

**කාරක**

**කර්ම කාරක**
බල + ඉණි
බැලිණි

කාරක **අතීත, අනාගත, වර්තමාන** යන කාලත්‍රයේ ආඛ්‍යාත ප්‍රත්‍ය සමග යෙදේ. එහි දී කර්තෘ කාරක හා කර්ම කාරක සඳහා ප්‍රථම, මධ්‍යම සහ උත්තම යන පුරුෂත්‍රය ද ඒක වචන හා බහු වචන භේදය ද බලපායි. එනමුත් භාවකාරකය සඳහා පුරුෂ හා වචන භේදය නැත. එහි ඇත්තේ ප්‍රථම පුරුෂ ඒක වචන ප්‍රත්‍ය පමණි.

අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය කර්තෘ කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | ඊ | බැලී | බල | ඌ | බැලූ |
| මධ්‍යම පුරුෂ | බල | ඊහි | බැලීහි | බල | ඌහු | බැලූහු |
| උත්තම පුරුෂ | බල | ඊමි | බැලීමි | බල | ඌමු | බැලූමු |

අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය කර්ම කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | ඉණි | බැලිණි | බල | උණු | බැලුණු |
| මධ්‍යම පුරුෂ | බල | ඉණිහි | බැලිණිහි | බල | උණුහු | බැලුණුහු |
| උත්තම පුරුෂ | බල | ඉණිමි | බැලිණිමි | බල | උණුමු | බැලුණුමු |

වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍ය කර්තෘ කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | යි | බලයි | බල | ති | බලති |
| මධ්‍යම පුරුෂ | බල | හි | බලහි | බල | හු | බලහු |
| උත්තම පුරුෂ | බල | මි | බලමි | බල | මු | බලමු |

වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍ය කර්ම කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | එයි | බැලෙයි | බල | එති | බැලෙති |
| මධ්‍යම පුරුෂ | බල | එහි | බැලෙහි | බල | එහු | බැලෙහු |
| උත්තම පුරුෂ | බල | එමි | බැලෙමි | බල | එමු | බැලෙමු |

## අනාගත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය කර්තෘ කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | අන්නේ | බලන්නේ | බල | අන්නෝ | බලන්නෝ |
| මධ්‍යම පුරුෂ | බල | අන්නෙහි | බලන්නෙහි | බල | අන්නෙහු | බලන්නෙහු |
| උත්තම පුරුෂ | බල | අන්නෙමි | බලන්නෙමි | බල | අන්නෙමු | බලන්නෙමු |

## අනාගත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය කර්ම කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | අන්නේ | බැලෙන්නේ | බල | අන්නෝ | බැලෙන්නෝ |
| මධ්‍යම පුරුෂ | බල | අන්නෙහි | බැලෙන්නෙහි | බල | අන්නෙහු | බැලෙන්නෙහු |
| උත්තම පුරුෂ | බල | අන්නෙමි | බැලෙන්නෙමි | බල | අන්නෙමු | බැලෙන්නෙමු |

## **භාව කාරකය කාලත්‍රයේ යෙදෙන අයුරු :**

අතීත කාලය
නට + ඉණි
නැටිණි

වර්තමාන කාලය
නට + එයි
නැටෙයි

භාව කාරකය

අනාගත කාලය
නට + එ + අන්නේ
නැටෙන්නේ

**ක්‍රියාකාරකම 01**

පන්තිය කණ්ඩායම් 3කට බෙදී කර්තෘ, කර්ම, භාව වශයෙන් කාරක තුනකට නම් කර එක් කණ්ඩායමක් පද 10 බැගින් කාලත්‍රයේ ලියා දක්වන්න.

**ක්‍රියාකාරකම 02**

කාරක තුන් ආකාරයට වචන 05 බැගින් තෝරා වාක්‍ය 05 බැගින් ගොඩනගන්න.